

කාර්යසාධන වාර්තාව

2022

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

අන්තර්ගතය

පරිච්ඡේදය 01 - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය **1-4**

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 1

1.3 ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 3

1.5 දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 4

1.6 දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල් 4

1.7 විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) 4

පරිච්ඡේදය 02 - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 5-6

පරිච්ඡේදය 03 – 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මුල්‍ය කාර්යසාධනය **7-12**

3.1 මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශය 7

3.2 මුල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය 8

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය 9

3.4 මුල්‍ය ප්‍රකාශ සටහන් 10

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය 10

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය 11

3.7 මු.රෙ.208 ප්‍රකාරව ,වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට /දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට /පළාත් සභාවට ප්‍රධානය කරන ලද ප්‍රතිපාදන 11

3.8 මුල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 11

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව **12-20**

පරිච්ඡේදය 04 - කාර්යසාධන දර්ශක **21-24**

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 21-24

පරිච්ඡේදය 05 - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය **25-27**

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 25-26

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 27

පරිච්ඡේදය 06 - මානව සම්පත් පැතිකඩ **28-30**

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 28

6.2 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපාන ආකාරය 28

6.3 මානව සම්පත් සංවර්ධනය 29-30

පරිච්ඡේදය 07 - අනුකූලතා වාර්තාව **31-41**

1. පරිච්ඡේදය - ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

රජය සතු ව්‍යාපාරයන්හි [1] යහපාලන පැවැත්ම තහවුරු කිරීම තුළින් එම ආයතනවල කාර්යසාධනය ඉහළ නැංවීමේ අරමුණින් රජය සතු ව්‍යාපාරයන්හි කාර්යසාධනය අධීක්ෂණය සිදු කරන මූලික රාජ්‍ය ආයතනය ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2002 වර්ෂයේදී නැවත ප්‍රතිස්ථාපනය කරන ලද අතර 1971 අංක 38 දරණ මුදල් පනතේ II කොටසේ විධිවිධාන අනුව රාජ්‍ය සංස්ථාවල මූල්‍ය පාලනය ස්ථාපනය කිරීමේ කටයුතු ද දෙපාර්තමේන්තුවේ විෂය පථය යටතට ගැනේ.

රජය සතු ව්‍යාපාර බලශක්තිය, ජලය, බැංකු හා රක්ෂණ, වරාය, පොදු ප්‍රවාහන, ගුවන් සේවා, ඉදිකිරීම් සහ ක්‍රමෝපායික අංශයන්හි සීමිත ව්‍යාප්තියක් පෙන්නුම් කරමින් ශ්‍රී ලංකා ආර්ථිකය තුළ සුවිශේෂී අංගයක්ව පවතී. රජය සතු ව්‍යාපාර 430 ක් අතරින් ව්‍යාපාර 52 ක් ජාතික ආර්ථිකය ඉහළ වර්ධන තලයකට පරිවර්තනය කිරීමෙහිලා උත්ප්‍රේරණ කාර්යයක් සිදු කරන අතර, මේවා ක්‍රමෝපායිකව වැදගත්වන රජය සතු වාණිජ ව්‍යාපාර [2] ලෙස හඳුනාගෙන ඇත. වර්තමානයේ රජය සතු ව්‍යාපාරවලින් 305 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් අධීක්ෂණය කරනු ලබන අතර ඉතිරි රාජ්‍ය ව්‍යාපාර 125 ජාතික අයවැය දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කෙරේ.

1.2. දෙපාර්තමේන්තුවේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

ශ්‍රී ලංකාවේ රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහතික කරනු ලබන ප්‍රධානතම ආයතනය බවට පත්වීම

මෙහෙවර

රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය උපරිමත්වයට පත්කිරීම සඳහා, විශිෂ්ට පරිචයන් භාවිතා කරමින් යහපත් අභිලාෂයන් සුරක්ෂිත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ශක්තිමත් කිරීම

අරමුණු

- රාජ්‍ය ව්‍යවසායයන් තුළ යහපාලනය වැඩි දියුණු කිරීම
- මහජන යහපත සුරක්ෂිත කිරීම
- හොඳම භාවිතයන් තුළින් කාර්යසාධනය ප්‍රශස්ත කිරීම


1.ඕනෑම ලිඛිත නීතියකින් ස්ථාපිත කොට ඇත්තා වූ රජයට අයිතිය හිමිවන රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල හෝ වෙනත් ඕනෑම ආයතනයක් සහ රජයට බහුතර අයිතිය හිමි වන්නා වූ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇති වාණිජ හෝ වාණිජ නොවන ක්‍රියාකාරකම් සිදු කරන්නා වූ සමාගම් රජය සතු ව්‍යාපාර වේ.

2.සේවා සහ භාණ්ඩ විකිණීම මඟින් ආදායම් උපයනු ලබන ව්‍යාපාර කටයුතු වල නියැලී සිටින රජය සතු ව්‍යාපාර රජය සතු වාණිජ ව්‍යාපාර වේ.

1.3. ප්‍රධාන කාර්යයන්

- රාජ්‍ය ව්‍යාපාර වෙනුවෙන් ප්‍රතිපත්ති සැකසීම.
- වාණිජ සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල සඳහා 1971 අංක 38 දරණ මුදල් පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට උපදෙස් දීම.
- රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය ක්‍රියාත්මක කිරීමට අදාළව නව චක්‍රලේඛ හා මාර්ගෝපදේශ නිකුත් කිරීම.
- අමාත්‍ය මණ්ඩල සංදේශවල සඳහන් යෝජනා අධ්‍යනය කිරීම හා විශ්ලේෂණය කිරීම.
- රජය සතු ව්‍යාපාර අධීක්ෂණය හා පාලනය.
- පුද්ගලීකරණය කරන ලද රජය සතු ව්‍යාපාරවලට අදාළව අවබෝධතා ගිවිසුම්වල ඇතුළත් කරුණු පසු විපරම් කිරීම හා එම ආයතන හා සම්බන්ධ ගැටළු විසඳීමට සහාය වීම.
- පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ කමිටුව සඳහා සහභාගී වීම සහ සහාය දැක්වීම.

1.4. සංවිධාන සටහන



කාර්යාල සේවක සේවය - 08
රියදුරු සේවය - 08

අ.අ.ජ - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
නි.අ - නියෝජ්‍ය අධ්‍යක්ෂ
ස.අ - සහකාර අධ්‍යක්ෂ
සං.නි - සංවර්ධන නිලධාරි
ක.සේ.නි - කළමනාකරණ සේවා නිලධාරි

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- කෘෂිකාර්මික අංශය
- සේවා අංශය
- ප්‍රතිපත්ති අංශය
- කාර්මික අංශය
- පාලන හා ගිණුම් අංශය

1.6. දෙපාර්තමේන්තුව යටතේ පවතින අරමුදල්

ඉන්ධන මිල ස්ථායිකරණ අරමුදල

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්) - අදාල නොවේ.

2. පරිච්ඡේදය – ප්‍රගතිය හා ඉදිරි දැක්ම

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව 2022 වසරෙහි ලබාගත් ප්‍රගතිය, එයින් රටට හා ජනතාවට ලැබෙන ප්‍රතිලාභ සහ 2023 වසරේදී ලඟාකර ගැනීමට අපේක්ෂිත ප්‍රගතිය

2022 වර්ෂයේ පැවති ගැටළුකාරී ආර්ථික තත්ත්වය තුල වුවද, ජලය, විදුලිය, එන්නත් ඇතුළු ඖෂධ, ගුවන්සේවා, ඉන්ධන සහ විශේෂයෙන්ම කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය සහන කාල ලබා දෙමින් බැංකු සේවාවන් වැනි අත්‍යවශ්‍ය සේවාවන් සපයමින් ජනතාවගේ ජීවන තත්ත්වය හා ජීවන මාර්ගයන් සුරක්ෂිත කිරීමට කැපීපෙනෙන භූමිකාවක් ඉටු කිරීමට රජය සතු ව්‍යාපාර මෙහෙයවීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සමත් විය.

2022 වර්ෂයේදී රජය සතු ව්‍යාපාර අතුරින් රාජ්‍ය ව්‍යාපාර 33 කින් රුපියල් මිලියන 22,005 ක අයබදු ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇත. එය එම වර්ෂයේ සංශෝධිත ඇස්තමේන්තුවට අනුව සියයට 63 ක ප්‍රමාණයක් වේ. කෙසේවෙතත් 2021 වර්ෂය සමඟ සැසඳීමේදී අයබදු ලැබූ ආයතන සංඛ්‍යාව 23 සිට 33 දක්වා ආයතන 10 කින් වර්ධනය වී ඇත. එසේම 2022 වර්ෂයේදී රුපියල් මිලියන 6,088 ක ලාභාංශ ආදායමක් රැස්කර ගැනීමට හැකියාව ලැබී ඇති අතර, එය සංශෝධිත ඇස්තමේන්තුවට සාපේක්ෂව සියයට 97 ක ප්‍රමාණයකි. එය 2021 වර්ෂයට සාපේක්ෂව සියයට 30 ක වැඩිවීමක් බව නිරීක්ෂණය කල හැකිය.

2023 වර්ෂයේදී රජය සතු ප්‍රධාන ව්‍යාපාරයන්ගෙන් අයබදු රු.මිලියන 30,039 ක් හා ලාභාංශ ආදායම වශයෙන් රු.මිලියන 5,633 ක් ලබා ගැනීමට අපේක්ෂා කෙරේ.

තවද, රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීමේ අරමුණ පෙරදැරි කර ගනිමින් 2021 ඔක්තෝබර් මස මෙම දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ අංශයක් ස්ථාපිත කළ අතර ඒ සඳහා සංවර්ධන නිලධාරීන් 05 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. මෙම අංශයේ අරමුණ වන්නේ රාජ්‍ය ව්‍යාපාරයන්හි මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කිරීම තුලින් ඒවායේ කාර්යසාධනය ඉහළ නැංවීම උදෙසා අවශ්‍ය කටයුතු සිදු කිරීම හා අධීක්ෂණය කිරීමයි. 2022 වර්ෂය අවසාන වන විට ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 ක මෙහෙයුම් හා මූල්‍ය කාර්යසාධනය විශ්ලේෂණය කර එම ආයතනවල ලාභදායීත්වය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය නිර්දේශ සහිත වාර්තා ඉදිරිපත් කර අවශ්‍ය මගපෙන්වීම් කර ඇති අතර, හඳුනාගත් ආයතන ඍජුව අධීක්ෂණය කිරීමේ කටයුතුවල නියැලී ඇත.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාරයන්හි මූල්‍ය හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් අධීක්ෂණය ශක්තිමත් කිරීම සඳහා අන්තර්ජාලය පාදක කරගත් පුළුල් කළමනාකරණ තොරතුරු පද්ධතියක් සැකසීමේ ක්‍රියාවලිය අවසන් කර ඇත. මෙමඟින් මූලික තොරතුරු සහ මෙහෙයුම් තොරතුරු එක් ස්ථානයක ගබඩා කිරීම සහ කළමනාකරණය කිරීම සිදු කරනු ලබයි. මෙම පද්ධතිය, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව සහ රාජ්‍ය ව්‍යාපාර අතර සන්නිවේදන මෙවලමක් ලෙස ක්‍රියා කරන අතර, රාජ්‍ය ව්‍යාපාර කාර්යක්ෂමව සහ ඵලදායී ලෙස විශ්ලේෂණය කිරීම, අධීක්ෂණය කිරීම, වාර්තා සකස් කිරීම සහ ජාතික අවශ්‍යතා සමඟ සමපාත වන ආයතනික දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා මෙම කළමනාකරණ තොරතුරු පද්ධතිය කාලානුරූපී දත්ත සපයනු ලබයි.

2022 දෙසැම්බර් අවසානය වන විට රාජ්‍ය ව්‍යාපාර 101 ක මූලික තොරතුරු පද්ධතියට ඇතුළු කරන ලදී. පසුගිය වර්ෂ 05 ක ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි මූලික දත්ත සහ වාර්ෂික දත්ත පද්ධතියට ඇතුළත් කර ඇති අතර, එම ආයතනවල වාර්ෂික වාර්තා සහ මාසික දත්ත ආකෘති ඇතුළත් කිරීම අවසන් කර ඇත. ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 ට අමතරව අනෙක් රාජ්‍ය ව්‍යාපාර සඳහා මාසික අධීක්ෂණය ආරම්භ කර ඇති අතර, තොරතුරු කළමනාකරණ පද්ධතිය හඳුන්වාදීමේ මූලික කටයුතු සිදු කරමින් පවතී. 2022 වර්ෂයේදී තොරතුරු කළමනාකරණ පද්ධතියේ නවමු වෙනස්කම් කිහිපයක් සිදු කළ අතර, එහිදී ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි පසුගිය වසර 05 කට අදාළ වාර්ෂික වාර්තා ලබා ගැනීමට, අදාළ වෙබ් සබැඳිය (Web Link) ඇතුළත් කර ඇත.

තව ද තොරතුරු පද්ධතියට ඇතුළත් කර ඇති ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 න් පළමු අදියර යටතේ ආයතන 12 ක් ‘‘සාමූහික අභිලාෂ ප්‍රකාශ’’ අත්සන් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, දැනටමත් ආයතන පහක් සමඟ ගිවිසුම්ගතව ඇත. එම ආයතන වනුයේ ජාතික ලොතරැයි මණ්ඩලය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, හලාවත වැවිලි සමාගම, කුරුණෑගල වැවිලි සමාගම වේ. මේ සම්බන්ධව අදාළ රාජ්‍ය ව්‍යාපාරවලින් කාර්ය සාධන වාර්තා කැඳවීම කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා සිදු කිරීමට නියමිතය.

රාජ්‍ය ව්‍යාපාර සඳහා පරිපාලන කටයුතු සහ මූල්‍යමය කටයුතු නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහය හා මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය සකස් කරමින් පවතී. එය රාජ්‍ය ව්‍යාපාර ආයතන සඳහා හඳුන්වාදීමත් සමඟ, එම ආයතනවලට තම ආයතනයට සුවිශේෂී වන පරිදි පරිපාලන කාර්ය සංවිධාන සංග්‍රහය හා මූල්‍ය කාර්ය පරිපාටි සංග්‍රහය සකස්කර ආයතනයේ කටයුතු සුමටව පවත්වාගෙන යාමට හැකියාව ලැබෙනු ඇත.

2021 වර්ෂයේ අගභාගයේදී නිකුත් කරන ලද මෙහෙයුම් අත්පොත (Operational Manual) සහ ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශය (Guideline on Corporate Governance) රාජ්‍ය ව්‍යාපාර විසින් අනුගමනය කිරීමේ පසු විපරම් කටයුතු ද 2022 වර්ෂයේදී සිදු කරන ලද අතර එම කටයුතු 2023 වර්ෂයේදී ද අවශ්‍ය සංශෝධන සහිතව ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ඇත.

පී. ඒ. එස්. අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

3 පරිච්ඡේදය - 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ථ මූල්‍ය කාර්යසාධනය

3.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

අයවැය 2022 රු.		සටහන	කළඹ 2022 රු.	2021 රු.	
-	ආදායම් ලැබීම්		28,092,481,812	30,590,893,194	
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	28,092,481,812	30,590,893,194	
41,000,000	**මුළු ආදායම් ලැබීම් (අ)**		28,092,481,812	**30,590,893,194**	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		111,784,487,387	35,687,073,655	ඒසීඒ-3
-	නැන්පතු		36,625	35,871	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		4,789,126	7,232,556	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		185,391,245,045	3,261,492	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**297,180,558,184**	**35,697,603,573**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**325,273,039,995**	**66,288,496,767**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඇ)		**800,596,332**	**3,958,969,952**	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**324,472,443,663**	**62,329,526,815**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**		-	-	
71,683,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	71,681,704	62,126,201	
27,428,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	26,876,836	21,229,321	ඒසීඒ-2(ii)
776,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	775,304	92,702,011	
-	පොළී ගෙවීම්	8	-	-	
-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	75,845	
99,887,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**99,333,844**	**176,133,378**	
	මූලධන වියදම්				
-	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම්	10	-	-	
764,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	763,636	890,386	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
136,935,052,000	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම්	13	136,895,097,785	54,354,893,957	
477,000	හැකියා වර්ධනය	14	476,093	333,000	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
136,936,293,000	**මුළු මූලධන වියදම් (උ)**		**136,896,337,513**	**54,356,117,343**	
	නැන්පතු ගෙවීම්		39,050	36,146	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		3,825,027	6,197,931	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		159,825,526,288	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**159,829,390,364**	**6,234,077**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		296,825,061,721	54,538,484,797	
-	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**27,647,381,943**	**7,791,042,018**	
	අග්‍රිම සැසඳුම් ප්‍රකාශය අනුව ශේෂය		**27,647,381,943**	7,791,042,018	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-	-	ඒසීඒ-3
			27,647,381,943	**7,791,042,018**	

1

3.2 මූල්‍ය තත්ත්ව පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-පී

2022 දෙසැම්බර් 31 දිනට
මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

	සටහන	තත්‍ය 2022 රු.	2021 රු.
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	36,664,014	35,900,378
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	10,967,876	11,931,975
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**47,631,890**	**47,832,354**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		10,964,376	11,926,050
දේපළ පිරියත හා උපකරණ සංචිතය		36,664,014	35,900,378
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසීඒ-5(බී)		
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	3,500	5,925
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**47,631,890**	**47,832,354**

පිටු අංක 1 සිට 26 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් කොරතුරු සහ ඇමුණුම් පිටු අංක 27 සිට 35 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිත කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් කොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 28/12/23

.....
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය : 23/02/2023

ඩී. ඒ. සුසන්ත අතුල කුමාර
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01.

.....
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම : 2023/02/23
දිනය :

ටී.පේ.සී. කරුණාරත්න
සහකාර අධ්‍යක්ෂ (මුදල්)
රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව
මහා භාණ්ඩාගාරය
කොළඹ 01

කේ.එම්.එම්. සිරිවර්ධන
මහා භාණ්ඩාගාරයේ සහ මුදල්,ආර්ථික ස්ථායීකරණ සහ
ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ ලේකම්
මුදල් අමාත්‍යාංශය
කොළඹ 01.

2

3.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ඒසිඒ-සී

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	තක්ෂ	
	2022 රු.	2021 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	445,177,934	3,261,492
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	-	-
අග්‍රිම ලැබීම්	111,784,487,387	35,687,073,655
අත්තිකාරම් අයකර ගැනීම්	4,853,028	3,404,543
තැන්පතු ලැබීම්	36,625	35,871
වෙනත් ප්‍රධාන ලෙජර	25,565,718,758	
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**137,800,273,732**	**35,693,775,561**
අඩුකළා : මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	98,465,850	62,094,741
සහනාධාර සහ මාරුකිරීම්	775,304	114,007,177
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	234,650	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	800,596,332	3,958,969,952
අත්තිකාරම් ගෙවීම්	3,825,027	3,732,509
තැන්පතු ගෙවීම්	39,050	36,146
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**903,936,213**	**4,138,840,524**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**136,896,337,519**	**31,554,935,037**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම		
උපණය අයකර ගැනීම්		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)		
අඩුකළා : මුදල් වැය කිරීම්		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම්	136,896,337,519	31,554,935,036
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**136,896,337,519**	**31,554,935,036**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(136,896,337,519)**	**(31,554,935,036)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	0	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
අඩුකළා : මුදල් වැය කිරීම්		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම (ඔ) = (උ)+(ඒ)	-	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	-	-

3

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

1. **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2022 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

2. **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

3. **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසළකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

4. **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

5. **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

6. **මුදල් හා මුදල් සමාන දෑ**

2022 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ආදයම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුල් ඇස්තමේන්තුව (රු.)	සංශෝධිත ඇස්තමේන්තුව (රු.)	ප්‍රමාණය (රු.)	සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
2002.03.00	ලාභ	38,000,000,000	34,700,000,000	22,004,727,426	63%
2002.04.00	ලාභාංශ	7,000,000,000	6,300,000,000	6,087,754,385	97 %
2006.01.00	වෙනත්	-	-	-	-

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	සංශෝධිත ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	603,680,000	99,887,000	99,333,844	99%
ප්‍රාග්ධන	130,568,500,000	136,936,293,000	136,896,337,513	99%

3.7 මු.රෙ. 208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු.

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදන වල % ලෙස
			මුල් ප්‍රතිපාදන (රු.)	සංශෝධිත ප්‍රතිපාදන (රු.)		
--	--	--	--	--	--	--

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

රු.

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2022 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2022 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේ දී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	1,047,564.35	1,047,564.35	--	100%
9152	යන්ත්‍රෝපකරණ	20,052,814.04	20,052,814.04	--	100%
9153	ඉඩම්		-		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්	අදාළ	-		
9160	කෙරීගෙන යන වැඩ	නොවේ	-		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.9 විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. } පීපීඩී/ඒ/ජීඊඩී/එෆ්ඒ/2022/08 ඔබේ අංකය உமது இல. Your No. }

දිනය திகதி Date } 2023 මැයි 31 දින

ගණන්දීමේ නිලධාරි

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව

ශීර්ෂය 241 - රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශීර්ෂය 241 රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2. මූල්‍ය සමාලෝචනය

2.1 ආදායම් කළමනාකරණය

2.1.1 ආදායම් ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා

2015 ජුනි 22 දිනැති 01/2015 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති චක්‍රලේඛයේ 03 ඡේදය හා මුදල් රෙගුලාසි 142 ප්‍රකාරව ආදායම් පුරෝකතනය සහ ඇස්තමේන්තු නිසි පරිදි සකස් කිරීමට කටයුතු කර නොතිබුණු අවස්ථා නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

(අ) ආදායම් සංකේතාංකය 20:02:03:00 - ලාභ

(i) 20:02:03:00 - ලාභ ආදායම් සංකේත වෙනුවෙන් 2022 වර්ෂය සඳහා රු.34,700,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණත්, සමාලෝචිත වර්ෂයේදී රැස්කර ඇති තත්‍ය ආදායම රු.22,004,727,426 ක් හෙවත් සියයට 63 ක් බව නිරීක්ෂණය විය.

(ii) මෙම ආදායම් සංකේතාංකයට අදාලව ආයතන 9 ක ආදායම් ඇස්තමේන්තුවලට සාපේක්ෂව තත්‍ය ආදායමේ අඩුවීම සියයට 3 ත් 98 ත් අතර පරාසයක පැවතුණි.

(iii) 2022 වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 09 ක් මඟින් රු.මිලියන 10,160 ක ආදායමක් උපයා ගැනීමට ඇස්තමේන්තු කර තිබුණද, සමාලෝචිත වර්ෂයේදී එම ව්‍යවසායන්වලින් කිසිදු ආදායමක් රැස් කරගෙන නොතිබුණි.

(iv) සමාලෝචිත වර්ෂයේදී රාජ්‍ය ව්‍යවසායන් 03 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර නොතිබුණත්, එම ව්‍යවසායන්ගෙන් රු. මිලියන 1,049.9 ක ලාභ ආදායමක් ලබාගෙන තිබුණි.

(v) රාජ්‍ය ව්‍යවසායන් 05 කින් ලාභ ආදායම් ඇස්තමේන්තු කර තිබුණත්, එම ව්‍යවසායන් විසින් ඇස්තමේන්තු කළ ලාභ ආදායමට වඩා වැඩියෙන් සියයට 75 ක සිට 540 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභ ආදායමට දායක වී තිබුණි.

(ආ) ආදායම් සංකේතාංකය 20:02:04:00 - ලාභාංශ ආදායම

(i) 20:02:04:00 - ලාභාංශ ආදායම් සංකේතය සඳහා 2022 වර්ෂයේදී රු.6,300,000,000 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබූ අතර, ඇස්තමේන්තුගත ආදායමින් සියයට 97 ක් හෙවත් රු.6,087,754,386 ක ආදායමක් සමාලෝචිත වර්ෂයේදී රැස්කරගෙන තිබුණි.

(ii) රාජ්‍ය ව්‍යවසායන් 5 කින් ලබා ගැනීමට ඇස්තමේන්තු කළ ලාභාංශ ආදායම ඉක්මවා සියයට 33 ක සිට සියයට 150 ක් දක්වා පරාසයක ප්‍රමාණයකින් ලාභාංශ ආදායමට දායක වී තිබුණි.

(iii) රාජ්‍ය ව්‍යවසායන් 11 කින් ලාභාංශ ආදායම් ලෙස ඇස්තමේන්තු කළ ආදායමට වඩා තත්‍ය ආදායම ලැබීමේ අඩුවීම සියයට 3 ක සිට 67 ක පරාසයක ප්‍රමාණයක් වී තිබුණි.

2.2 වියදම් කළමනාකරණය

(අ) 2022 අප්‍රේල් 26 දිනැති අංක 03/2022 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වර්ෂය තුළ වියදම් දැරීම සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනවල ඉතිරිවීම් ඇතිනම් සාම්ප්‍රදායිකව සිදු කරන පරිදි ඒවා වර්ෂය අවසන් වීමට පෙර වෙනත් වියදම් සඳහා යොදවා නොගත යුතු බව දක්වා තිබුණද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් වැය විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කර තිබුණි.

(i) වැය විෂයයන් 4 කට අදාළව ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම හේතුවෙන් එකතුව රු.508,152,000 ක ප්‍රමාණයක් එනම් සියයට 0.4 ක සිට සියයට 125 දක්වා පරාසයකින් මුදල් රෙගුලාසි 66/69 යටතේ ප්‍රතිපාදන වැඩි කරගෙන තිබුණි.

(ii) වැය විෂයයන් 14 ක මූලික ඇස්තමේන්තුගත ප්‍රතිපාදන ප්‍රමාණය අවශ්‍ය ප්‍රමාණය ඉක්මවා සලසා ගැනීම හේතුවෙන් එකතුව රු.508,152,000 ක් එනම් සියයට 0.5 සිට සියයට 99 දක්වා පරාසයකින් සමාලෝචිත වර්ෂයේදී ප්‍රතිපාදන අඩු කරගෙන තිබුණි.

(ආ) වැය විෂයයන් පරීක්ෂා කිරීමේදී පහත සඳහන් නොසැසඳෙන අවස්ථා නිරීක්ෂණය විය.

වැය විෂයය හා විස්තරය	වැය ලෙජරයට අනුව වර්ෂයේ වියදම්	භාණ්ඩාගාර මුද්‍රිත අනුව වර්ෂයේ වියදම්	වෙනස
	රු.	රු.	රු.
241-1-1-2301-008 ප්‍රාග්ධන දායකත්වය - ජාතික ජලසම්පාදන හා ජලාපවාහන මණ්ඩලය	12,151,552,659	19,290,897,758	7,139,345,099
241-1-1-2301-30 ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල	25,565,718,757	24,543,438,157	1,622,280,600

2.3 බැඳීම් හා බැරකම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල සටහන් අංක (iii) හි දක්වා ඇති බැරකම් ප්‍රමාණයට අමතරව රු.361,218 ක බැරකම් හා බැඳීම්වලට සමාලෝචිත වර්ෂයේදී එළඹ තිබුණි.

(ආ) මු.රෙ. 94 (1) ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් සේවයක් හෝ සැපයුමක් සඳහා වාර්ෂික ඇස්තමේන්තු වල ඒ සඳහා වූ මුදල් ප්‍රතිපාදන ඉක්මවා කිසිම වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳිය යුතු වුවද, වැය විෂයයන් 2 ක් යටතේ ඉතිරිවීම් ඉක්මවා රු.253,293 ක බැරකම්/ බැඳීම්වලට එළඹ තිබුණි.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

2020 අගෝස්තු 28 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 02/2022 හි 10 ඡේදය හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය ප්‍රකාරව විගණකාධිපතිවරයා වෙත වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ වාර්ෂික කාර්ය සාධන වාර්තාව ද ඉදිරිපත් කළ යුතු වුවද, රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව 2023 පෙබරවාරි 28 දින වන විට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2008 මැයි 22 දින මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද අංක 1550/7 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ 7 ඡේදය ප්‍රකාරව ශ්‍රී ලංකාවෙන් ආරම්භ වන ගුවන් ගමන් සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත නිකුත් කරන හෝ අලෙවි කරන සෑම මගී ප්‍රවේශ පත්‍රයක් සම්බන්ධයෙන්ම එවැනි ටිකට්පත් විකිණීමේ ආකාරය සහ හෝ නිකුත් කිරීම නොසලකා ඇ.ඩො. 60 ක අධිභාරයක් හෝ එම මුදලට සමාන මුදලක් අය කරනු ලැබිය යුතු බවත්, එම ගැසට් පත්‍රයේ 8 ඡේදය ප්‍රකාරව එලෙස එකතු කරගනු ලබන අධිභාර මුදල් සිවිල් ගුවන් සේවා අධ්‍යක්ෂ ජනරාල් විසින් නියම කළ හැකි පරිදි ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු බවත් දක්වා ඇත. ඒ අනුව 2008 අගෝස්තු 01 දින සිට 2022 දෙසැම්බර් 31 දින දක්වා සිවිල් ගුවන් සේවා අධිකාරිය විසින් එම අධිභාරය ලෙස රු.මිලියන 16,982 ක් එකතු කර ගෙන තිබුණ ද, එම මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද, මේ සම්බන්ධයෙන් 2017 ජුනි 12 දින නීති කටයුතු දෙපාර්තමේන්තුව විසින් නීතිපති දෙපාර්තමේන්තුවේ මතය වන "මෙම අධිභාරය තවදුරටත් අය කර ගැනීමට හැකියාව ඇති බවත්, එම අධිභාර මුදල් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමේ නීතිමය බැඳීමක් පවතින බවත්" සඳහන් කර 2017 අප්‍රේල් 07 දිනැති

නීතිපති දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ලිපිය ද සමඟ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් දැනුවත් කර තිබුණි. එසේ වුවද, විගණිත දිනය වන විටත් මෙම අධිභාර මුදල සිවිල් ගුවන් සේවා අධිකාරියෙන් අයකර ගැනීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාග්ධන දායකත්වය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i). රාජ්‍ය සංස්ථා සහ කොටස් හිමිකාරිත්වය දරන රාජ්‍ය ව්‍යාපාර සහ රාජ්‍ය සමාගම් 13 ක් විසින් ඉදිරිපත් කරන ලද සෘජු ශේෂ සනාථ කිරීම් අනුව 2022 දෙසැම්බර් 31 දිනට එම ආයතනයන්හි ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 985,745 ක් වූ අතර, රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම ශේෂය රු. මිලියන 149,875 ක් වීම හේතුවෙන් 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ ප්‍රාග්ධන දායකත්වය රු. මිලියන 835,870 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ii). 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කළ සෘජු ශේෂ සනාථකිරීම් සහ රජයේ මූල්‍ය ප්‍රකාශන අතර ආයතන 07 කට අදාළව රජයට අයත් කොටස් සංඛ්‍යාවෙහි වෙනස්කම් නිරීක්ෂණය විය. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රාග්ධන දායකත්වය රු.මිලියන 1,877 ක් අඩුවෙන් රාජ්‍ය මූල්‍ය ප්‍රකාශන තුළ ගිණුම්ගත කර තිබුණි.

(iii). රාජ්‍ය සමාගමක හිමිකාරිත්වය දරන කොටස් සංඛ්‍යාව හා එහි නාමික අගය අනුව විගණනයේදී කල ගණනය කිරීමේදී 2022 දෙසැම්බර් 31 දිනට වටිනාකම රු.මිලියන 5,141 ක් වුවද, එය රජයේ මූල්‍ය ප්‍රකාශන තුළ රු. මිලියන 14,476 ක් ලෙස දක්වා තිබුණි. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශන වල රු.මිලියන 9,336 ක් වැඩියෙන් ප්‍රාග්ධන දායකත්වය දක්වා තිබුණි.

(iv). ප්‍රාදේශීය සංවර්ධන බැංකුවේ ප්‍රාග්ධන තත්ත්වය Capital Adequacy (Tier 1) වැඩිදියුණු කර ගැනීම සඳහා ඊට පෙර ලංකාපුත්‍ර සංවර්ධන බැංකුව විසින් ලබාගෙන තිබූ රු.මිලියන 175 ක මහා භාණ්ඩාගාරයට ගෙවිය යුතු ණය මුදල හිලව් කර ගනිමින් 2022 දෙසැම්බර් මස 15 දින රු.මිලියන 175 ක් වටිනා කොටස් 6,183,946 ක් නිකුත් කර තිබුණ ද, එය 2022 දෙසැම්බර් 31 දිනට රජයේ මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර නොතිබුණි.

(v). රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුළ රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩිවීම රු.මිලියන 1,405,204 ක් වූ අතර ඉන් රු.මිලියන 109,625 ක් එනම් සියයට 8 ක් එක් එක් ආයතනවල පුනරාවර්තන ස්වරූපයේ එනම් ණය සහ ණය පොළී ගෙවීම් සහ වැටුප් හා වේතන ගෙවීම් සඳහා මහා භාණ්ඩාගාරය වෙතින් නිදහස් කරන ලද මුදල්වලින් සමන්විත විය.

(vi). රජයේ මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය තුල රජයට අයත් ව්‍යාපාරවල ප්‍රාග්ධන දායකත්වයේ වැඩි වීම රු.මිලියන 1,405,204 ක් වූ අතර ඉන් රු.මිලියන 1,246,401 ක් එනම් සියයට 89ක් 2023 පෙබරවාරි 07 දිනැති අමප 23/0154/604/014 දරන අමාත්‍ය මණ්ඩල තීරණය යටතේ රජය සතු ව්‍යාවසායන්හි හඳුනාගත් වගකීම් ශ්‍රී ලංකා රජයේ ශේෂ පත්‍රයට පැවරීම යටතේ ගලපන ලද අගයන් නිසා වූ බලපෑම බව නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

අංකය	ආයතනය	රජය සතු ව්‍යවසායන්හි හඳුනා ගත් වගකීම් යටතේ රජයේ ශේෂ පත්‍රයට ගැලපූ අගය
		රු.
1	Ceylon Electricity Board	362,307,620,369
2	Ceylon Petroleum Corporation	884,093,386,477
	එකතුව	1,246,401,006,846

(ඇ) "මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම" යන ප්‍රධාන කාර්යය යටතේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ පවතින ආයතන වල වාර්ෂික වාර්තා නියමිත දිනවල පාර්ලිමේන්තුවේ සභාගත කිරීම පිළිබඳ පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුවේ කාර්යයක් විය. මේ සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුව ඉදිරිපත් කළ තොරතුරු පිළිබඳ පරීක්ෂා කිරීමේදී පහත කරුණු නිරීක්ෂණය විය.

(i). දෙපාර්තමේන්තුවේ අධීක්ෂණයට ලක්වන ආයතන 305 ක් පැවතිය ද, විගණනයට තොරතුරු ඉදිරිපත් කර තිබුණේ රාජ්‍ය ව්‍යවසායන් 52 කට අදාල ව වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමේ තොරතුරු පමණි. ඒ අනුව, ආයතන 248 ක එනම් සියයට 83 කට අදාල ව එම තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීය.

(ii). ඉදිරිපත් කළ තොරතුරු අනුව, එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් 2021 වර්ෂයට අදාල වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණේ රාජ්‍ය ව්‍යවසායන් 23 ක් පමණි. කෙසේ වෙතත් එම රාජ්‍ය ව්‍යවසායන් 23 අතුරින් වාර්ෂික වාර්තා 17 ක් පමණක් පාර්ලිමේන්තු නිල වෙබ් අඩවියේ විගණිත දිනය වූ 2023 මැයි 24 වන දින වන විට සටහන් වී තිබුණි.

(iii). 2022 වර්ෂය වෙනුවෙන් එකී රාජ්‍ය ව්‍යවසායන් 52 න් පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව වෙත විගණිත දින වන විට වාර්ෂික වාර්තා ඉදිරිපත් කර තිබුණේ රාජ්‍ය ව්‍යවසායන් 5 ක් පමණි.

(iv). 2021 වර්ෂයේදී හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා ආයතනික පාලනය පිළිබඳ මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 පරිච්ඡේදය පරිදි වාර්ෂික කාර්යය සාධන ඇගයීම් රැස්වීමේ දී වාර්ෂික වාර්තා ඉදිරිපත් කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී ද ඒ පිළිබඳව රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ මැදිහත්වීම ද ඉතා පහල මට්ටමක පැවතුන බව නිරීක්ෂණය විය.

4. මානව සම්පත් කළමනාකරණය

4.1 අනුයුක්ත කාර්ය මණ්ඩලය හා තත්‍ය කාර්ය මණ්ඩලය

(අ) 2022 වර්ෂයේ දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තුවේ පැවති පුරප්පාඩු 07 තුළ ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 03ක් පැවති අතර, ද්විතික මට්ටමේ නිලධාරීන්ගේ සංවර්ධන නිලධාරී සේවයේ අතිරික්තතා 03 ක් සහ කළමනාකරණ සේවා නිලධාරී සේවයේ පුරප්පාඩු 4 ක් පැවතුණි. විස්තර පහත පරිදි වේ.

සේවක වර්ගය	අනුමත තනතුරු සංඛ්‍යාව	තත්‍ය තනතුරු සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව	අතිරික්තය
ජ්‍යෙෂ්ඨ මට්ටම	28	25	03	-
තෘතියික මට්ටම	05	05	-	-
ද්විතික මට්ටම	33	32	04	03
ප්‍රාථමික මට්ටම	16	16	-	-
එකතුව	**82**	**78**	**07**	**03**

(ආ) කර්මාන්ත අමාත්‍යාංශය මඟින් වැටුප් ගෙවනු ලබන එක් නිලධාරියෙකු 2011 ජනවාරි 01 දින සිට වසර 12 ක් රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ සේවය කරන බව නිරීක්ෂණය විය.

බී.ඔ.ඩී.ප්‍රනාන්දු
ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

4 පරිච්ඡේදය – කාර්යසාධන දර්ශක

4.1 ආයතනයේ කාර්යසාධන දර්ශක (2022 ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම			
	100% - 90%	**89% - 75%**	**74% - 50%**	**49% - 0%**
1. රාජ්‍ය ව්‍යාපාර වල යහපාලනය දියුණු කිරීම				
1.1. රාජ්‍ය ව්‍යාපාරවල යහපාලනය සහ මූල්‍ය විනය ස්ථාපිත කිරීම සඳහා මඟ පෙන්වීම සහ නියෝග නිකුත් කිරීම				
සාමූහික ගිවිසුම් වලට අදාළ මාර්ගෝපදේශ නිකුත් කිරීම				
චක්‍රලේඛ සංඛ්‍යාව	100%			
මාර්ගෝපදේශ සංඛ්‍යාව				
අත්පොත් සංඛ්‍යාව				
1.2. පරිපාලන අත්පොත් සකස් කිරීම සඳහා මාර්ගෝපදේශ නිකුත් කිරීම				
පරිපාලන අත්පොත් සංඛ්‍යාව				
1.3 ප්‍රතිපත්තිමය කාරණා හැසිරවීම				
හසුරුවන ලද ප්‍රතිපත්තිමය කාරණා සංඛ්‍යාව		80%		
1.4 පෞද්ගලීකරණයෙන් පසු ගැටළු හැසිරවීම				
හසුරුවන ලද ගැටළු සංඛ්‍යාව		84%		
1.5 ආයතන අවසන් කිරීමේ ගැටළු				
පැවැත්වූ රැස්වීම් ගණන			67%	
ඉදිරිපත් කරන ලද කැබිනට් පත්‍රිකා සංඛ්‍යාව				
1.6 ඌණ ක්‍රියාකාරී වත්කම් හා ආයතන පනත යටතේ ක්‍රියාකාරකම්	100%			
2. රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය අධීක්ෂණය කිරීම				
2.1. ඉහළ, මධ්‍යම හා පහළ මට්ටම්වල ප්‍රමුඛතා අධීක්ෂණ මත පදනම්ව රාජ්‍ය ව්‍යාපාරවල සැලසුම් අධීක්ෂණය කිරීම.				
රාජ්‍ය ව්‍යාපාරවල ප්‍රධාන ගැටළු හඳුනා ගැනීම				
හඳුනාගත් ගැටළු ප්‍රමාණය		83%		
රැස්වීම් කැඳවීම හෝ අවශ්‍ය පරිදි ගැටළු සාකච්ඡා කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල සමඟ සන්නිවේදනය කිරීම.				
පැවැත්වූ රැස්වීම් ගණන	91%			

ආයතනික සැලසුම්, ක්‍රියාකාරී සැලසුම් හා 2022 වාර්ෂික අයවැය වාර්තා සමාලෝචනය කර අවශ්‍ය අවස්ථාවලදී රාජ්‍ය ව්‍යාපාර සමඟ සාකච්ඡා කිරීම.				
සමාලෝචනය කරන ලද සැලසුම් ප්‍රමාණය		87%		
2.2. රාජ්‍ය ව්‍යාපාරවල කාර්යසාධනය කාලානුරූපීව අධීක්ෂණය කිරීම.				
අධීක්ෂණ ආකෘති සංවර්ධනය කිරීම සහ කාර්යසාධන වාර්තා සකස් කිරීම				
සකස් කරන ලද කාර්ය සාධන වාර්තා ගණන		86%		
අයවැය සහ තත්‍ය අතර භිඩැස් හඳුනාගැනීම				
සමාලෝචනය කරන ලද කාර්ය සාධන වාර්තා ගණන	97%			
අවශ්‍යතම් හේතු විමසීම සහ නිවැරැදි ක්‍රියාමාර්ග ගැනීම	95%			
2.3. ව්‍යාපාරික යෝජනා ඇගයීම සහ විශ්ලේෂණය කිරීම				
ඇගයීම සහ විශ්ලේෂණය කරන ලද යෝජනා ගණන	93%			
2.4 අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අදහස් සම්පාදනය කිරීම.				
අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සංඛ්‍යාව	100%			
2.5 රාජ්‍ය ව්‍යාපාර වල ගැටලු හැසිරවීම/ නිරාකරණය කිරීම				
ලියා ඇති ලිපි සංඛ්‍යාව	80%			
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව / වාර්තා සංඛ්‍යාව	90%			
සිදු කරන ලද ක්ෂේත්‍ර චාරිකා ගණන	100%			
3.කොටස්කරුවන්ගේ අභිලාෂය ආරක්ෂා කිරීම				
3.1 වාර්ෂික අයවැය, උපායමාර්ගික සැලැස්ම සහ මූල්‍ය තත්ත්වය සැළකිල්ලට ගෙන රාජ්‍ය ව්‍යාපාරවල බදු /ලාභාංශ ඇස්තමේන්තු කිරීම.				
ඇස්තමේන්තු සංඛ්‍යාව සහ අයබදු හා ලාභාංශවලින් අපේක්ෂිත මුළු වටිනාකම			69%	
3.2 2022 වර්ෂයේ අයබදු සහ ලාභාංශ එකතු කිරීම				
2022 වර්ෂයේ අයබදු සහ ලාභාංශ මුළු මුදල			69%	
3.3 සහභාගී වූ වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ මහා සභා රැස්වීම්				
සහභාගී වූ වාර්ෂික මහා සභා රැස්වීම් සහ අතිවිශේෂ මහා සභා රැස්වීම් සංඛ්‍යාව	100%			
3.4. රාජ්‍ය ව්‍යාපාර ගැටලු සම්බන්ධයෙන් විගණකාධිපති/ බාහිර විගණකවරු එලදායි විගණන අධීක්ෂණය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැපයීම				
සිදු කරන ලද විගණන ගැටළු පිළිබඳ සන්නිවේදන සංඛ්‍යාව		84%		

3.5. මුදල් පනතේ ප්‍රතිපාදන වලට අදාළව රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් මුදල් ඇමතිතුමාගේ එකඟතාවය ලබාදීම				
ලද ඉල්ලීම් ලිපි සංඛ්‍යාව සහ යවා ඇති එකඟතා ලිපි සංඛ්‍යාව	100%			
3.6. භාණ්ඩාගාරයේ අභිලාෂය ආරක්ෂා කිරීමට යටත්ව, ප්‍රධාන ගනුදෙනු සඳහා අනුමැතිය ලබාදීම				
අනුමත ප්‍රධාන ගණුදෙනු සංඛ්‍යාව	100%			
3.7. භාණ්ඩාගාර නියෝජිත රැස්වීම් පැවැත්වීම				
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව	100%			
පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	100%			
3.8 ප්‍රාදේශීය වතු ඉඩම් උප බදු දීම, පැවරීම සහ අන්සතු කිරීම සඳහා ස්වර්ණමය භිමිකාරත්ව ප්‍රතිපත්තියේ මාර්ගෝපදේශය				
සකස් කළ මාර්ගෝපදේශ සංඛ්‍යාව				
3.9 ප්‍රාදේශීය වතු සමාගම් නියෝජිතයන් සමඟ ස්වර්ණමය භිමිකාරිත්ව රැස්වීම් සංවිධානය කිරීම				
සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව				
4.මහජන අභිලාෂයන් ආරක්ෂා කිරීම				
4.1. පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට සහාය වීම.				
පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සකස් කිරීම				
සකස් කරන ලද පාර්ලිමේන්තු කාරක සභා වාර්තා ප්‍රමාණය	100%			
අදාළ රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් සඳහා සහභාගී වීම				
සහභාගී වූ පාර්ලිමේන්තු කාරක සභා ප්‍රමාණය	100%			
රාජ්‍ය ව්‍යාපාර විසින් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා නිර්දේශ ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම්				
යවන ලද පසු විපරම් සංඛ්‍යාව	100%			
පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලද පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා වාර්තා සම්බන්ධයෙන් (මධ්‍යකාලීන/අවසන්)ඉදිරිපත් කරන ලද රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ නිරීක්ෂණ				
ඉදිරිපත් කළ නිරීක්ෂණ වාර්තා ප්‍රමාණය		75%		
4.2. වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම				
අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් ලියන ලද නිරීක්ෂණ සංඛ්‍යාව	100%			
පාර්ලිමේන්තුවට ප්‍රමාද වී ඉදිරිපත් කරන ලද වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය වෙත වාර්තා කිරීම	100%			

4.3. රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම				
ක්‍රියාත්මක කරන ලද යෝජනා සංඛ්‍යාව		80%		
සංවිධානය කරන ලද පසු විපරම් රැස්වීම් සංඛ්‍යාව			75%	
4.4. රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම් සහ මුල්‍ය ප්‍රකාශන පිලියෙල කිරීම				
අදාල ආයතනවලට 2022 රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ශ්‍රේණියේ ගිණුම් සහ මුල්‍ය ප්‍රකාශන නියමිත කාල සීමාව තුල ඉදිරිපත් කිරීම	100%			
4.5. 2022 කාර්ය සාධන වාර්තාව සකස් කර නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම				
නියමිත කාලසීමාව තුළ කාර්ය සාධන වාර්තාව ඉදිරිපත් කිරීම	100%			
4.6. මුදල් අමාත්‍යාංශයේ 2022 වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාළ පරිච්ඡේදය සකස් කිරීම				
මුදල් අමාත්‍යාංශයේ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර සඳහා අදාල පරිච්ඡේදය නියමිත කාලසීමාව තුළ ඉදිරිපත් කිරීම	100%			
4.7. 2022 මුල්‍ය කලමනාකරණ වගකීම් පනතට අදාළ වාර්තා සඳහා රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් වූ පරිච්ඡේදය සකස් කිරීම				
2022 මුල්‍ය කලමනාකරණ වගකීම් පනතට අදාලව රාජ්‍ය ව්‍යාපාර වල කාර්ය සාධනය දැක්වෙන පරිච්ඡේදය නියමිත කාලසීමාව තුල ඉදිරිපත් කිරීම	100%			
4.8. මහ බැංකු වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම				
මහ බැංකු වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම	100%			
4.9. මහ බැංකු අර්ධ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාල පරිච්ඡේදය පිලියෙල කිරීම				
මහ බැංකු අර්ධ වාර්ෂික වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම	100%			
4.10. මධ්‍ය වාර්ෂික මුල්‍ය තත්ත්ව වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කිරීම				
මධ්‍ය වාර්ෂික මුල්‍ය තත්ත්ව වාර්තාවේ රාජ්‍ය ව්‍යාපාර වලට අදාළ පරිච්ඡේදය පිළියෙළ කර ඉදිරිපත් කිරීම	100%			

5 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්ක/ අරමුණු	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රතිශතය		
			0%-49%	50%-74%	75%-100%
1. ඵලදායිතා ක්‍රියාකාරකම්වලට අනුකූලව ව්‍යවසායකත්ව සහ නිර්මාණශීලීත්වයට සහය දක්වන්නා වූ සංවර්ධනාත්මක දිශානතියකින් යුත් ප්‍රතිපත්ති ප්‍රවර්ධනය කිරීම. මූල්‍ය සේවාවන්ට ප්‍රවේශ වීමේ අවස්ථාව සලසමින් ක්ෂුද්‍ර කුඩා පරිමාණ සහ මධ්‍ය පරිමාණ ව්‍යවසායකයන් දිරි ගැන්වීම. (SDG.8.3)	ව්‍යාපාරික යෝජනා ඇගයීම සහ විශ්ලේෂණය කිරීම (41)	ව්‍යාපාරික යෝජනා සංඛ්‍යාව (38)			93%
	අමාත්‍ය මණ්ඩල සංදේශ සඳහා නිරීක්ෂණ සහ අදහස් සැපයීම (111)	නිරීක්ෂණ සහ අදහස් සපයන ලද අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව (108)			97%
	ඉහළ, මධ්‍යම, පහළ මට්ටම් ලෙස ප්‍රමුඛතාගත අධීක්ෂණ මට්ටම අනුව රාජ්‍ය ව්‍යාපාර කාලීනව අධීක්ෂණය කිරීම (165)	හඳුනාගත් ගැටළු ප්‍රමාණය (54) පැවැත් වූ රැස්වීම් ගණන (64) සමාලෝචනය කරන ලද සැලසුම් සංඛ්‍යාව (26)			87%
	රාජ්‍ය ව්‍යාපාර වල ගැටලු හැසිරවීම/ නිරාකරණය කිරීම (2750)	ලියා ඇති ලිපි සංඛ්‍යාව (2547) සංවිධානය කරන ලද රැස්වීම් සංඛ්‍යාව (163) නිරීක්ෂණ චාරිකා සංඛ්‍යාව (30)			99%
	රාජ්‍ය ව්‍යාපාර සඳහා වූ අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම (05)	ක්‍රියාත්මක කරන ලද අයවැය යෝජනා සංඛ්‍යාව (03)			60%
2. සියලු සමාගම් තිරසාර සංවර්ධනයක් යොදා ගැනීමට පෙළඹවීම සහ ඔවුන්ගේ වාර්තා කිරීමේ ක්‍රියාවලියට තිරසාර තොරතුරු ඒකාබද්ධ කිරීම. (SDG.12.5)	රාජ්‍ය ව්‍යාපාර වල කාර්යසාධනය අධීක්ෂණය කිරීම (151) දත්ත පද්ධතිය හරහා රාජ්‍ය ව්‍යාපාර අධීක්ෂණය කිරීම (101)	සකස් කරන ලද සමාලෝචන වාර්තා ප්‍රමාණය (129) දත්ත පද්ධතියට ඇතුළත් කළ රාජ්‍ය ව්‍යාපාර සංඛ්‍යාව (101)			85% 100%

3. ජාතික ප්‍රතිපත්ති හා ප්‍රමුඛතා අනුව තිරසාර මහජන ප්‍රසම්පාදන භාවිතයන් ප්‍රවර්ධනය කිරීම. (SDG.12.7)	රාජ්‍ය ව්‍යාපාර ගැටලු සම්බන්ධයෙන් විගණකාධිපති, බාහිර විගණකවරු ඵලදායි විගණන අධීක්ෂණය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැපයීම (68)	ගන්නා ලද පිලියම් ක්‍රියාමාර්ග සංඛ්‍යාව (57)			83%
	පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාවට සහාය වීම (27)	සකස් කල වාර්තා සංඛ්‍යාව(27)			100%
	පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභා රැස්වීම් වලට සහභාගී වීම (31)	රැස්වීම් සංඛ්‍යාව (31)			100%
	වාර්ෂික වාර්තා නියමිත කාලසීමාව තුළ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් පසු විපරම් කිරීම (140)	වාර්ෂික වාර්තා සම්බන්ධයෙන් ලියන ලද නිරීක්ෂණ සංඛ්‍යාව (36) ඉදිරිපත් කල වාර්තා සංඛ්‍යාව (104)			100%

5.2 තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

තිරසාර සංවර්ධන ඉලක්ක ඉටුකර ගැනීමේදී ජයග්‍රහණයක් ලෙස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව විසින් රජය සතු ව්‍යාපාර සඳහා වෙබ් පාදක කළමනාකරණ තොරතුරු පද්ධතියක් හඳුන්වාදීම දැක්විය හැකිය. මෙම පද්ධතිය හඳුන්වාදීමේ පරමාර්ථය වන්නේ රාජ්‍ය ව්‍යාපාර වල අධීක්ෂණ ධාරිතාවය ශක්තිමත් කිරීම සඳහා රජය සතු ව්‍යාපාර වල වැදගත් තොරතුරු ඇතුලත් කිරීමයි.

2022 අවසාන වන විට රාජ්‍ය ව්‍යාපාර 101 ක මූලික තොරතුරු, පද්ධතියට ඇතුළත් කරන ලදී. පසුගිය වසර 05 ක පමණ ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි මූලික දත්ත, වාර්ෂික දත්ත ඇතුළත් කිරීම සම්පූර්ණ කර ඇති අතර එම ආයතන වල වාර්ෂික වාර්තා සහ මාසික දත්ත සඳහා ආකෘති ඇතුළත් කිරීම අවසන් කර ඇත. ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 ට අමතරව අනෙකුත් රාජ්‍ය ව්‍යාපාර සඳහා මාසික අධීක්ෂණය ආරම්භ කර ඇත.

2022 වසරේ දී තොරතුරු කළමනාකරණ පද්ධතියේ නවමු වෙනස්කම් කිහිපයක් සිදුකළ අතර, එහිදී ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 හි පසුගිය වසර 5 කට අදාල වාර්ෂික වාර්තා ලබා ගැනීමට, අදාල වෙබ් සබැඳිය (Web Link) ඇතුලත් කර ඇත.

තොරතුරු පද්ධතියට ඇතුලත් කර ඇති ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 52 න් පළමු අදියර යටතේ ආයතන 12 ක් ‘‘සාමූහික අභිලාෂ ප්‍රකාශ’’ අත්සන් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර දැනටමත් ගිවිසුම් 5කට එළඹ ඇත. එම ආයතන වනුයේ ජාතික ලොතරැයි මණ්ඩලය, සංවර්ධන ලොතරැයි මණ්ඩලය, ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය, හලාවත වැවිලි සමාගම සහ කුරුණෑගල වැවිලි සමාගම වේ. මේ සම්බන්ධව කාර්යසාධන වාර්තා කැඳවීම කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා සිදු කිරීමට නියමිතය.

2022 වසර අවසාන වනවිට ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 40 ක් පමණ පදනම් කරගෙන, එම ආයතනවල පසුගිය වසර 10 ක කළමනාකරණ තොරතුරු පද්ධතියේ දත්ත ඇසුරින් කාර්යසාධනය, ලාභදායිත්වය, ද්‍රවශීලතාවය වැනි ක්ෂේත්‍රවල විශ්ලේෂණයක් මූල්‍ය අනුපාත විග්‍රහය ඇසුරින් සිදු කරන ලදී.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ තොරතුරු කළමනාකරණ පද්ධතිය හරහා රාජ්‍ය ව්‍යාපාරවල ‘‘වාර්ෂික අයවැය’’ පද්ධතිය තුළට උඩුගත කිරීම සිදුකල අතර නිවැරදි ආකාරයට අයවැය සකස් කරන ආකාරය පිළිබඳව ප්‍රධාන රාජ්‍ය ව්‍යාපාර 40 ක් පමණ කැඳවා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

2022 වසර තුළ , කළමනාකරණ තොරතුරු පද්ධතිය හරහා ලබාගත් දත්ත ඇසුරින් ධීවර සංස්ථාව, ජනතා වතු සංවර්ධන මණ්ඩලය, රාජ්‍ය වැවිලි සංස්ථාව, ශ්‍රී ලංකා හස්ත කර්මාන්ත මණ්ඩලය, ධීවර වරාය නීතිගත සංස්ථාව වැනි ආයතනවල මූල්‍ය, මෙහෙයුම්, කාර්ය සාධනයන් විශ්ලේෂණය කර වාර්තා කිරීම සිදුකර ඇත.

තිරසාර සංවර්ධන ඉලක්ක ළඟාකර ගැනීමේදී රාජ්‍ය ව්‍යාපාරවල කාලීන දත්ත නියමිත කාලසීමාව තුළ ලබා ගැනීම අප දෙපාර්තමේන්තුවට පවතින ප්‍රධාන අභියෝගයක් ලෙස දැක්විය හැකිය.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)
ජ්‍යෙෂ්ඨ	28	25	03
තෘතීයික	05	05	0
ද්විතියික	33	32	01
ප්‍රාථමික	16	16	0

6.2 ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපාන ආකාරය

නිලධාරීන් විශ්‍රාම යෑම සහ ස්ථාන මාරු ලබා යෑම තුළ සහ 2022 වර්ෂයේදී නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 14/2022, 14/2022 (I) හා 14/2022 (II) මඟින් රාජ්‍ය නිලධාරීන් හට දේශීය හා විදේශීය වැටුප් රහිත නිවාඩු ලබා ගැනීමට ඇති හැකියාව මත මෙම පුරප්පාඩු ඇති වී තිබෙන අතර මෙම පුරප්පාඩු පිරවීම සඳහා මුදල් අමාත්‍යාංශයේ නිර්දේශය සහිතව රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වෙත ඉල්ලීම් සිදු කර ඇත.

6.3. මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩ සටහනේ කාල සීමාව	සමස්ත ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම
			දේශීය (රු.)	විදේශීය		
පුහුණු						
ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකවරුන්ගේ ඵලදායීතාවය සංවර්ධනය කිරීම	1	දින 1	5,000.00		දේශීය	ගුණාත්මක වැඩ පරිසරයක් සඳහා ඵලදායීතාවය වැඩි කර ගැනීමට අදාළව රියදුරන් සහ කාර්යාල කාර්ය සහායකවරුන්ගේ දැනුම හා ආකල්ප වර්ධනය
Microsoft Excel පුහුණු	3	දින 2	36,000.00		දේශීය	Microsoft Excel පිළිබඳ පුහුණු
සංවර්ධන නිලධාරීන්ගේ හා කළමනාකරණ සේවා නිලධාරීන්ගේ හැකියා සංවර්ධනය	1	දින 1	10,000.00		දේශීය	කාර්යාලයේ එදිනෙදා කටයුතු ඵලදායීව හා කාර්යක්ෂමව කිරීමට අවශ්‍ය දැනුම හා ආකල්ප වර්ධනය
කාර්යාල සටහන් හා කාර්යාල ලිපි ලිවීමේ පුහුණුව	1	දින 1	5,000.00		දේශීය	
Advanced Certificate in Data Analytics	5	මාස 6	298,000.00		දේශීය	පරිගණක ආශ්‍රිත දත්ත විශ්ලේෂණය හා සම්බන්ධ දැනුම හා පුහුණුව
පෞර්ෂ සංවර්ධනය හා මනස සැහැල්ලු කිරීමේ එක් දින වැඩමුළුව	සියලු කාර්ය මණ්ඩලය	දින 1	163,092.50		දේශීය	මානසික පීඩනය අවම කිරීම හා කාර්යාල කටයුතු පිළිබඳ ආකල්ප වර්ධනය කිරීම
China Multilateral Programs	4	සති 3	මාර්ගගත වැඩමුළුවකි		විදේශීය	චීන භාෂාව, ව්‍යවසායකත්වය, මූල්‍ය කළමනාකරණය හා ශූන්‍ය පාදක අයවැය ක්‍රමවේද යනාදිය පිළිබඳ දැනුම
Taking on Green PFM and Climate Change - **දිල්ලි,** ඉන්දියාව	1	දින 6	8,602.00	ඇ.ඩො. 240.00	විදේශීය	හරිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ සංකල්පය හා එහි ක්‍රමවේද පිළිබඳ දැනුවත්භාවය හා හරිත රාජ්‍ය මූල්‍ය කළමනාකරණ ක්‍රමවේද අයවැයට ඇතුළත් කිරීමට අවශ්‍ය පුහුණුව

වෘත්තීය ආයතනවල සාමාජිකත්වය පවත්වාගෙන යාම						
CA Sri Lanka වාර්ෂික සමුළුවට සහභාගී වීම	1	වාර්ෂික	28,000.00			මූල්‍ය විශ්ලේෂණය පිළිබඳ විශේෂඥ දැනුම සහිත වෘත්තිකයන් පවත්වාගෙන යාම ඊට සමගාමී අනෙකුත් විෂය දැනුම වර්ධනය තුළින් රාජ්‍ය ව්‍යාපාරවල මූල්‍ය අංශයේ කටයුතු පිළිබඳ එම ආයතනවලට අවශ්‍ය උපදේශනය හා පුහුණුව ලබා දීම
CPFA හා APFA හි වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	3	වාර්ෂික	30,000.00			
CIMA වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	3	වාර්ෂික		පවුම් 918		
CA Sri Lanka වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	2	වාර්ෂික	52,000.00			
CMA වෘත්තීය සාමාජිකත්වය පවත්වා ගැනීම සඳහා වාර්ෂික ගාස්තු ගෙවීම	1	වාර්ෂික	9,000.00			
CA Sri Lanka හි පුහුණුව ලබා දෙන ආයතනයක් වශයෙන් වාර්ෂික ගාස්තු ගෙවීම		වාර්ෂික	17,500.00			

07 පරිච්ඡේදය – අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ විෂය පථයට අයත් නොවේ.	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ		
1.6	වෙනත් (ඉන්ධන මිල ස්ථායීකරණ අරමුදල)	අනුකූල වේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**	අනුකූල වේ		
3.1	මූල්‍ය බලතල ආයතනය තුල බලතල පවරාදී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුල දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134 (2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40 (4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134 (3) ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7.	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04 ක් වත් අදාළ වර්ෂය තුල පවත්වාගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තාකර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ. 772 අනුව සිදු කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල නොවේ	2022 වර්ෂයේ පැවති ඉන්ධන අර්බුදය සහ දැනට සලාක ක්‍රමයට ඉන්ධන සැපයීම සිදු කරන නිසා නිසි පරිදි ඉන්ධන ලබා ගැනීමට නොහැකි වීම නිසා ඉන්ධන කාර්යක්ෂමතාවය පරීක්ෂා කිරීමට නොහැකි වී ඇත.	ඉන්ධන සැපයීම යථා තත්ත්වයට පත් වූ පසු අදාළ පරීක්ෂණ කටයුතු සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම.	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94 (1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නෙඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන් වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම.	අනුකූල වේ		
14.2	මු.රෙ. 371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම.	අනුකූල වේ		
14.3	මු.රෙ. 371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදයම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
	සාමාජිකයන් වෙත රාජකාරි ලැයිස්තු ලිඛිතව ලබාදී තිබීම			
16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018 (1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම.	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුල තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
20	**විගණන ඡේද වලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කල විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		